www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 14 S

කතෝලික ධර්මය | කාලය පැය දෙකයි

නම ..............................................

උපදෙස් : සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,

- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරන්නේ,
i. සමාරියෙනි. ii. ගලීලයෙනි. iii. ජුදයෙනි. iv. පලස්තීනයෙනි.

02. ලූක් සුබාරංචිය පිළිගන්වනු ලැබුවේ
i. තියෝපිලස්ට ය. ii. ගමාලියෙල්ට ය. iii. නාතාන්ට ය. iv. සිමියොන්ට ය.

03. "මරියාණෙනි බිය නොවන්න ඔබ ............. වරප්‍රසාද ලද්දේහිය. ලූක් 1: 30 ට අනුව හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
i. ශුද්ධාත්මයාණන්ගෙන් ii. පියාණන් වහන්සේගෙන්
iii. දෙවියන් වහන්සේගෙන් iv. පුත්‍රයාණන් වහන්සේගෙන්

04. සෙකරියස් තුමාගේ යාගයෙන් ආරම්භ වන සුබාරංචි ග්‍රන්ථයේ සංකේතය වන්නේ,
i. ගවයා ය. ii. රාජාලියා ය. iii. මිනිසා ය. iv. සිංහයා ය.

05. මාගේ අසල්වැසියා කවරෙක්ද යන්න විනයධරයන් නැගූ ප්‍රශ්නයට ජේසුස් වහන්සේ පිලිතුරු දුන්නේ,
i. මුහුන් පිළිබඳ උපමාවෙනි. ii. අකීකරු පුත්‍රයාගේ උපමාවෙනි,
iii. දැල පිළිබඳ උපමාවෙනි. iv. යහපත් සමරිතානුවරයාගේ උපමාවෙනි.

06. දාවිත් රජතුමාගෙන් ලෝක ගැලවුම්කරුවාණන් පැමිණෙන බව දාවිත් රජතුමාට දන්වනු ලැබුවේ.
i. නාතාන් දිවැසිවරයා ය ii. එලියා දිවැසිවරයා ය iii. යෙසායා දිවැසිවරයා ය iv. ආමොස් දිවැසිවරයා ය

07. එම්මානුවෙල් යන්නෙහි අර්ථය වන්නේ,
i. දෙවියන් වහන්සේගේ මිත්‍රයාය. ii. දෙවියන් වහන්සේ අප සමඟය.
iii. දෙවියන් වහන්සේ ගලවන සේක. iv. දෙවියන් වහන්සේ උසස් කළ සේක.

08. "නියමිත පමණට වැඩියෙන් අයබදු නොගන්න" යනුවෙන් ස්නාවක ජොහාන් තුමා අනුශාසනා කරනුයේ,
i. අයකැමියන්ට ය. ii. ප්‍රභූවරුන්ට ය. iii. හමුදා නිළධාරීන්ට ය. iv. සාමාන්‍ය ජනතාවට ය.

09. ලූක් සුබාරංචියයේ දෙවන වෙලුම ලෙස සලකනු ලබන්නේ,
i. ජොහාන් සුබාරංචියයි. ii. මාක් සුබාරංචියයි. iii. ආපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතයි iv. මතෙව් සුබාරංචියයි

10. ස්නාවක ජොහාන්තුමා ජනතා මෙහෙවර ආරම්භ කරනු ලැබුවේ
i. ගලීලයෙනි ii. සීනායි කන්දෙනි iii. ක්‍රිද්‍රෝන් විල අසලෙනි iv. ජෝනෝන් තොටුපොළෙනි.

- අංක 11-15 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරන්න.

11. ලූක් සුබාරංචියේ ජේසුස් වහන්සේගේ වංශාවලිය .......................................... ආරම්භ කරනු ලබයි.

12. මෝසෙස් තුමාගේ නීතියට අනුව සෑම ජුදා ......................................... දේව මාලිගයේ කැප කළ යුතුය.

13. ජේසුස් වහන්සේගේ උපත පළමුවෙන් ම ...................................... ප්‍රකාශ කළේය.

14. පාලුකරයේ මොරගසන හඩ ස්නාවක ජොහාන් තුමා බව ............................................. සඳහන් කරයි.

15. ජුදා සමාජය අයකැමියන් .................................... ලෙස සලකා කොන් කළහ.

(එඬේරුන්ට, ආදම්ගෙන්, යෙසායා දිවැසිවරයා, පව්කරුවන්, කුළුදුල් පිරිමි දරුවෙක් ම,
ජෙරමියා දිවැසිවරයා, ශාස්ත්‍රවන්තයන්ට)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

✹ අංක 16-20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් "✓" ලකුණ ද, වැරදි නම් "×" ලකුණ ද යොදන්න.

16. සෙකරියස්තුමා ජුදා ආගමේ පූජකයෙකි. (.............)

17. ජේසුස් වහන්සේ මහ සිකුරාදා දින කොටළුවෙකු පිට නැගී ජෙරුසලමට පිවිසි සේක (.............)

18. ස්නාවක ජොහාන්තුමාගේ දේව කාර්යය වූයේ ජේසුස් වහන්සේගේ පෙර මග සූදානම් කිරීමය (.............)

19. මතෙව්තුමා ජේසුස් වහන්සේගේ වංශාවලිය ආබ්‍රහම්තුමා ගෙන් ආරම්භ කරනු ලබයි. (.............)

20. ලුක් සුබාරංචිය ක්‍රි.ව. 80-90 කාලයේදී සම්පාදනය වී ඇත. (.............)

(ල: 2 x 20 = 40)

## II - පත්‍රය

❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. i. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳව සඳහන් කරන සුවිශේෂක කතුවරුන් දෙදෙනා නම් කරන්න.
ii. ස්නාවක ජොහාන්තුමා ආහාරයට ගනු ලැබුවේ මොනවාද?
iii. ලුක් සුබාරංචිය හා ක්‍රියාපොත ලුක්තුමාගේ ම බව තහවුරු කරනු ලබන කරුණු 2 ලියන්න.
iv. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ ඉදිරිපත් කරනු ලබන සිදුවීම් 2 ක් ලියන්න.
v. පහත ගීතිකා පදය සම්පූර්ණ කරන්න.
මරියතුමීගේ පෙම්බර මුහුණේ එළියක් දිස්වූයේ
.................................................................................
vi. ස්නාවක ජොහාන්තුමාගේ දෙමාපියන් නම් කරන්න.
vii. ලුක් සුබාරංචියේ සඳහන් කාන්තා චරිත 2 ක් නම් කරන්න.
viii. ජේසුස් වහන්සේගේ කාලයේ පලස්තීනය බෙදුණු ප්‍රධාන කොටස් 2 ක් ලියන්න.
ix. දේව සැලැස්මට අනුගාමී වීමට ඔබට කළ හැකි දේවල් 2 ක් ලියන්න.
x. ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.

(ලකුණු 2 x 10= 20)

02. i. ලුක් සුබාරංචියේ පරමාර්ථය ලියන්න.
ii. පාවුලුතුමා රෝමයේ සිරගතව සිටින විට ලුක්තුමා ද එහි වූ බව සනාථ කෙරෙන ශුද්ධ ලියවිලි පාඨ 3 ලියන්න.
iii. අපගේ හැකියා දක්ෂතා දෙවියන් වහන්සේ වෙනුවෙන් යෙදවිය හැකි අවස්ථා 5 ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

03. i. දේව පණිවිඩය අවිශ්වාස කළ සෙකරියස් තුමාට හිමි වූ විපාකය කුමක්ද?
ii. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ ජුසේතුමාට සිහිනයකින් දැනුම් දුන් කරුණු 3 ක් ලියන්න.
iii. දෙවියන් වහන්සේ අපට කතා කරන මාර්ග 5 ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

04. i. ශුද්ධාත්මයාණන්ගේ සුබාරංචිය ලෙස ලුක් සුබාරංචිය හැඳින්වීමේ හේතුව කුමක්ද?
ii. ලුක් සුබාරංචිය හඳුන්වනු ලබන වෙනත් නම් 3 ක් ලියන්න.
iii. කොන්වූවන්ට ජේසුස් වහන්සේ අනුකම්පා කරන බව දැක්වීමට ඉදිරිපත් කළ සකේවුස් පිළිබඳ සිද්ධිය කෙටියෙන් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

05. i. සමාජය තුළ ඉහළ මට්ටමේ වැජඹුන ප්‍රභූවරුන්ට ස්නාවක ජොහාන් තුමා අමතන්නේ කුමන නමකින්ද?
ii. ස්නාවක ජොහාන්තුමා අනුශාසනා කළ සමාජ කණ්ඩායම් තුන නම් කර ඔවුන්ට ලබා දුන් අනුශාසනා වෙන වෙන ම ලියන්න.
iii. ස්නාවක ජොහාන් තුමාගේ අනුශාසනා තුලින් ඔබට ලැබෙන මගපෙන්වීම් 5 ක් ලියන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

06. i. මරියතුමිය හා ජුසේතුමා ජේසුතුමාව කැප කිරීම සඳහා රැගෙන යන්නේ කොහේටද?
ii. ලුක් සුබාරංචිය යාච්ඤාවේ සුබාරංචිය ලෙස ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු 3 ක් ලියන්න.
iii. යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීමට අවශ්‍යය ශක්තිය පතා කෙටි යැදුමක් නිර්මාණය කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk